# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2145/51 - 2019 ඔක්තෝබර් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2019.10.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4/3/2/2016/A/463.
*ප්‍රාදේශීය ලේකම්ගේ අංකය* : KMB/LAN/ACQUI/02/83.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවයේ විස්තරය:*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 331 මාපලාන මගින් පහළ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මු.පි. මාර 2813 හි පෙන්නුම් කරන පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

**කැබලි අංකය 1**

ඉඩමේ නම: ගිරිගහහේනවත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 10-50 පමණ වයසැති කොස් ගස් 22ක්, අඹ ගස් 13, මැහෝගනී ගස් 1ක්, රබර් ගස් 54 ක්, කිතුල් ගස් 39 ක්, කොකෝවා ගස් 1 ක්, දූරියන් ගස් 2 ක්, ගොරක ගස් 2 ක්, ඇට්ටෝනියා ගස් 9 ක්, පුවක් ගස් 80ක්, ඇඹරැල්ලා ගස් 2 ක්, ඩොන්ගා ගස් 2 ක්, ඔලිද මාර ගස් 1 ක්, තිඹිරි ගස් 1 ක්, ටර්පන්ටයින් ගස් 1 ක්, රුක්අත්තන ගස් 4 ක්, කරාබුනැටි ගස් 10 ක්, කජු ගස් 3 ක්, කැටකාල ගස් 1 ක්, බෙලි ගස් 2 ක්, මිශ්‍ර වගාවක්, ස්ථිර ගොඩනැගිලි 3 ක් සහ ළිඳක් ඇත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 7; ප්‍රමාණය: හෙක්ටයාර 1.8525.

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 නොවැම්බර් මස 13 වැනි දින පෙ.ව. 9.30 ට කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2019 නොවැම්බර් මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

චින්තක අබේවික්‍රම,
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2019 ඔක්තෝබර් මස 14 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 154



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.